# 2 පංච පුස්තකය

පංච පුස්තකය යනුවෙන් හඳුන්වන්නේ, ශුද්ධ බයිබලයේ පළමු පොත් පහ යි. පංච පුස්තකය විවිධ නම්වලින් හඳුන්වනු ලබයි. ඒවා නම්;

- ★ ව්‍යවස්ථාවලිය
- ★ මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව
- ★ නීතිය
- ★ මෝසෙස් තුමාගේ නීතිය

හෙබ්‍රෙව් බසින් මෙම පොත් පහ, 'ටෝරා' යනුවෙන් නම් කෙරේ. පංච පුස්තකය ලෙස නම් කරන පොත් පහ මෙසේ ය.




## උත්පත්ති පොත

මෙය ශුද්ධ බයිබලයේ පළමු පොත යි. දෙවි පියාණන් වහන්සේගේ අපිරිමිත ආදරය හා කරුණාව නිසා මිනිසා මැවීම, පාපයට වැටුණු මිනිසා ගැලවීම සඳහා "ඉශ්‍රායෙල්" ජනතාව තෝරා ගැනීම හා ඔවුන්ගේ පියවරුන්ට දුන් පොරොන්දු ඉටු කිරීම ආදිය මෙහි විස්තර වී ඇත. එය කියවා, දෙවි පියාණන් වහන්සේගේ ආදරය තේරුම් ගෙන, අපි එකිනෙකාට ආදරයෙන් කටයුතු කළ යුතු බව තේරුම් ගනිමු.

### උත්පත්ති පොතේ ඇතුළත් කරුණු කෙටියෙන්

★ දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම
★ ආදම් හා ඒව පාපයට වැටීම
★ කායින් හා ආබෙල් පිළිබඳ කතා පුවත
★ නෝවා හා ජල ගැල්ම
★ මිනිසා ඉදි කළ බාබෙල් කොත
★ ආදිපිතෘ ආබ්‍රහම් තුමා, ඊසාක් තුමා, ජාකොබ් තුමා සහ ජනනායක ජෝසෙප් යන අය දෙවි පියාණන් වහන්සේ කෙරෙහි තැබූ විශ්වාසය.

## නික්මයාම පොත

ශුද්ධ බයිබලයේ ඇතුළත් දෙවන පොත යි. ඉශ්‍රායෙල් ඉතිහාසයේ කේන්ද්‍රීය සිද්ධිය වන මිසරයේ වහල්කමින් නිදහස ලබා, පොරොන්දු දේශය කරා "නික්මයාම" මුල් කරගෙන ලියවී ඇත. මෝසෙස් තුමා මෙහි ප්‍රධාන චරිතය යි. නික්මයාම ගමන තුළ දෙවිය න් වහන්සේගේ ආදරය හා ආරක්ෂාව ඉශ්‍රායෙල් ජනතාව අත්දුටු ආකාරය මෙහි විස්තර වේ. "සීනයි" ගිවිසුම තුළින් "දස පනත්" ලබා දී දෙවියන් වහන්සේගේ ම ජනතාව ලෙස "ඉශ්‍රායෙල්" ජනයා පිළිගත් බව ද මෙහි සඳහන් වේ.



2.1 රූපය - නික්මයාම

### නික්මයාම පොතේ කරුණු කෙටියෙන්

★ පාරාවෝ රජතුමා ඉශ්‍රායෙල් ජනයාට හිරිහැර කිරීම
★ දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජුගෙන් ගලවා ගෙන පොරොන්දු දේශයට ගෙන යාම
★ එම ගමන අතරතුර සීනයි කන්දේ දී දස පනත ලබා දීම
★ මෝසෙස් තුමාගේ දූත මෙහෙවර

ඉශ්‍රායෙල් ජනයා අත්දුටු ආකාරයට ම දේව ආදරය අපටත් අත්දැකීමට ආරාධනා කරයි. තව ද ඔවුන් වහන්සේට අපේ ආදරය දැක්විය යුතු බව මතක තබා ගනිමු.

**ක්‍රියාකාරකම**

(1) මෙම සටහන අභ්‍යාස පොතේ පිටපත් කර, සම්පූර්ණ කරන්න.




(2) (i) පංච පුස්තකයේ පොත් පහට අමතර ව ශුද්ධ බයිබලයේ අඩංගු වෙනත් පොත් **පහක්** නම් කරන්න.

(ii) ශුද්ධ බයිබලය පෙරළා, උත්පත්ති පොතේ හැඳින්වීම කියවා, එය වාක්‍ය **පහකින්** ලියන්න.

(iii) ශුද්ධ බයිබලය පෙරළා, නික්මයාම පොතේ හැඳින්වීම කියවා, එය වාක්‍ය **පහකින්** ලියන්න.



***ජීවිතයට බිඳක්***

***සියල්ල මැවූ දෙවි පියාණන්ට ප්‍රශංසා කරන්න.***